ජාතික ගිණුම් ඇස්තමේන්තු; තෙවන කාර්තුව 2020

දළ දේශීය නිෂ්පාදිතය; නිෂ්පාදන ප්‍රවේශය

(2010 පාද වර්ෂය )

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

1. 2020 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ තෙවන කාර්තුව (ජුලි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත. 2020 වර්ෂයේ තෙවන කාර්තුව ආරම්භ වූයේ ව්‍යාපාර කටයුතු සහ දෛනික ජන ජීවිතය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන වටපිටාවක සිටිමිනි. මෙම සුබදායී වතාවරණය කාර්තුව මුළුල්ලේ ම පැවති අතර එය බොහෝ ආර්ථික කටයුතු කෙරෙහි ඵලදායී ලෙස බලපාමින් 2020 තෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ සියයට 1.5ක වර්ධනයක් ඇති කිරීමට සමත්ව ඇත.

2020 වර්ෂයේ තෙවන කාර්තුව කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ඵලදායී කාලච්ඡේදයක් බවට පත්වී ඇත. නිමැවුම් කර්මාන්ත අංශයේ වාර්තා වූ ප්‍රසාරණය සමග සමස්ත කර්මාන්ත අංශය විවිධ බාධක මධ්‍යයේ වුව ද තරමකට සැහීමට පත්විය හැකි තරමේ තත්ත්වයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතු සම්බන්ධයෙන් සැලකූ විට තොරතුරු තාක්ෂණ සේවා, විදුලි සංදේශ සේවා සහ මූල්‍ය සේවා යන ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු තරමේ ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ප්‍රවාහන සේවා තවදුරටත් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බව පැහැදිලි වේ. කෙසේ වෙතත් සංචාරක ක්ෂේත්‍රයේ තවදුරටත් පවතින කඩාවැටීම පෙන්නුම් කරමින් ආහාරපාන සහ නවාතැන් පහසුකම් සැපයීම උප ආර්ථික කටයුත්ත සෘණ වර්ධනයක් පෙන්නුම් කර ඇත. දැඩි සෞඛ්‍ය ක්‍රියාමාර්ග සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් අනෙකුත් පෞද්ගලික සේවා ආර්ථික කටයුත්ත තවදුරටත් සෘණ වර්ධනයක් වාර්තා කර ඇත.

2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 2.4ක් ලෙස වාර්තා වූ ආර්ථික වර්ධන වේගය 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 1.5ක් ලෙස වාර්තා වී ඇත. එහිදි 2020 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 4,085,213 ක් සහ ස්ථාවර මිල (2010) ගණන් යටතේ රුපියල් මිලියන 2,545,863 ක් වශයෙන් වාර්තා වේ. 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 3,833,960 ක් සහ රුපියල් මිලියන 2,509,418 ක් වශයෙන් වාර්තා විය.

2020 තෙවන කාර්තුවේ දී, ආර්ථිකයේ ප්‍රධාන සංරචක හතර වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.2 ක්, සියයට 27.7 ක්, සියයට 56.8 ක් සහ සියයට 7.4 ක් ලෙස වාර්තා වේ. තව ද 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 4.3ක්, සියයට 0.6ක් සහ සියයට 2.1ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. (රූපසටහන 1)

රූපසටහන 1 -තෙවන කාර්තුවේ වර්ධන වේගයන් (2019 සහ 2020)




2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු අතුරින් “වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම” සියයට 256.6ක කැපීපෙනෙන ධන වර්ධනයක් වාර්තා කර ඇත. එසේ ම තවත් ආර්ථික කටයුතු කිහිපයක් ම එලෙස සැලකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. ඒ අතුරෙන් “මිරිදිය ධීවර කටයුතු” (සියයට 20.6), “වී වගා කිරීම” (සියයට 15.5), “එළවළු වගා කිරීම”(සියයට 11.6), “රබර් වගා කිරීම” (සියයට 11.5), “පළතුරු වගා කිරීම”(සියයට 8.3), “කුළුබඩු වගා කිරීම” (සියයට 6.0) යනාදි ආර්ථික කටයුතු ප්‍රමුඛ වේ. මේ අතර “කරදිය ධීවර කටයුතු”, “වන ද්‍රව්‍ය”, “පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව” සහ “තේ වගා කිරීම” පිළිවෙලින් සියයට 11.6ක්, සියයට 7.8ක්, සියයට 5.1ක් සහ සියයට 4.3ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

2020 වර්ෂයේ මුල් භාගයේ දී කොවිඩ් වසංගතයේ බලපෑමට වඩාත් දැඩිව ලක්වූ කර්මාන්ත ආර්ථික කටයුතු 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී මන්දගාමීව නමුත් යථාතත්වයට පත්වෙමින් පවතින බව පෙන්නුම් කරමින් සියයට 0.6 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එහිදී නිමැවුම් කර්මාන්ත කටයුතු වාර්තා කර ඇති සියයට 5.3 ක් වූ වර්ධනය, එම කටයුතු වේගයෙන් යථාතත්ත්වයට පත්වී ඇති බව පෙන්නුම් කරයි. නිමැවුම් කර්මාන්ත කටයුතු අතුරෙන් “රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන”, “ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන”, “කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන” පිළිවෙලින් සියයට 13.1ක්, සියයට 11.5ක් සහ සියයට 10.2ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේ ම “රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන” සහ “අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන” පිළිවෙලින් සියයට 4.8ක් සහ සියයට 4.2ක් වශයෙන් සැලකිය යුතු වර්ධන වේගයන් වාර්තා කර ඇත.

“රෙදිපිළි, ඇගළුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන” උප ආර්ථික කටයුත්ත වර්ෂයේ මුල් භාගයේ දී කොවිඩ් වසංගතයේ අහිතකර බලපෑමට වැඩි වශයෙන් ලක්වූ අතර 2020 තෙවන කාර්තුවේ දී සියයට 0.1ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. තව ද 2020 තෙවන කාර්තුවේ දී “මූලික ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන”, “ගල්අඟුරු නිෂ්පාදනය හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන” සහ “දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන” පිළිවෙලින් සියයට 6.9ක්, සියයට 6.2ක් සහ සියයට 5.1ක් වශයෙන් ධන වර්ධන

වේගයන් වාර්තා කර ඇත. එසේ ම "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම ", "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම", "අපවහන පද්ධති" යන කර්මාන්ත ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 2.1ක්, සියයට 4.1ක් සහ සියයට 8.6 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "ඉදිකිරීම් කර්මාන්ත කටයුතු " සහ "පතල් හා කැනීම් කටයුතු" පිළිවෙලින් සියයට 9.1ක් සහ සියයට 6.8ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් 2020 තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

2020 තෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු වාර්තා කර ඇති වර්ධනයේ දී ප්‍රධාන වශයෙන් ම "විදුලි සංදේශ සේවා", "තොරතුරු තාක්ෂණ සේවා" සහ "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා" වාර්තා කර ඇති පිළිවෙලින් සියයට 16.5ක්, සියයට 13.5ක් සහ සියයට 12.3ක් වූ ඉහළ ධන වර්ධන වේගයන් කැපී පෙනේ. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.0ක පමණ දායකත්වයක් උසුලන "තොග හා සිල්ලර වෙළඳාම" 2020 තෙවන කාර්තුවේ දී සියයට 2.9ක වර්ධනයක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වය සහිත "ප්‍රවාහනය" වසරේ මුල් භාගයේ දී දැඩි පසුබෑමකට ලක් වී තිබූ නමුත් මෙම කාර්තුවේ දී යථාතත්ත්වයට පත්වෙමින් පවතින බව පෙන්නුම් කරමින් සියයට 0.9ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එසේ ම "තැපැල් සේවා සහ කූරියර් සේවා", "සෞඛ්‍ය සේවා", "රක්ෂණ සේවා", "දේපොළ වෙළඳාම්" යන සේවා ආර්ථික කටයුතු ද පිළිවෙලින් සියයට 7.0ක්, සියයට4.6ක්, සියයට 4.1ක් සහ සියයට 3.1ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී "අනෙකුත් පෞද්ගලික සේවා" සියයට 0.5ක සුළු පසුබෑමක් වාර්තා කර ඇති අතර "නවාතැන්, ආහාර පාන සැපයීම්" සේවා ආර්ථික කටයුත්ත කොවිඩ් වසංගතයේ අහිතකර බලපෑමට තවදුරටත් දැඩි ලෙස ලක්වී ඇති බව පෙන්නුම් කරමින් සියයට 42.1ක පසුබෑමක් වාර්තා කර ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකය (2010=100) 2010 වර්ෂය පාද වර්ෂය ලෙස ගෙන ආර්ථිකයේ මිල ගණන් වැඩිවී ඇති ප්‍රතිශතය මැන දක්වන අතර එම දර්ශකය 2020 තුන්වන කාර්තුව සඳහා දර්ශක අගය 160.5ක් ලෙස වාර්තා වන අතර එය පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ දී 152.8ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2020 තෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකයට අනුව වාර්තා වන උද්ධමනය සියයට 5.0කි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) මෙම කාර්තුවේ දී 135.7ක් ලෙස වාර්තා වන අතර 2019 තෙවන කාර්තුවේ දී එය 130.4ක් ලෙස වාර්තා විය. ඊට අනුව 2020 තෙවන කාර්තුවේ දී වාර්තා වන උද්ධමනය සියයට 4.1කි.

### 1.1 කෘෂිකාර්මික ක්‍රියාකාරකම්

බෝහෝ කෘෂිකාර්මික බෝග වගාවන් යල සහ මහ වශයෙන් කන්න දෙකක් යටතේ වගා කෙරෙන අතර යල කන්නය සාමාන්‍යයෙන් මැයි සිට සැප්තැම්බර් දක්වාත්, මහ කන්නය සාමාන්‍යයෙන් ඔක්තෝම්බර් සිට අප්‍රේල් දක්වාත් දිවේ. ඒ අනුව මෙම බෝගයන්ගේ එකතු කළ වටිනාකම් කාර්තු

අනුව ඇස්තමේන්තු කිරීමේ දී අදාල සම්බන්ධිත ආයතන විසින් ලබා දෙන අවසාන ඇස්තමේන්තු සේ ම යාවකාලික ඇස්තමේන්තු ද පදනම් කර ගනී.

“කෘෂිකර්මය,වනද්‍රව්‍ය සහ ධීවර කටයුතු” සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 4.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 8.2 පමණ වේ. පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ දී මෙහි වාර්තා වී ඇති වර්ධනය සියයට 1.0ක් වු අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.2 ක පමණ දායකත්වයක් උසුලනු ලැබීය.

“ධාන්‍ය වගා කිරීම” කෘෂි ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේදී සියයට 256.6 කැපී පෙනෙන ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර එය 2019 තෙවන කාර්තුවේ දී වාර්තා කර තිබුණේ සියයට 2.1 ක වර්ධනයකි. මෙම කාර්තුවේ දී වාර්තා වන මෙම ඉහළ වර්ධනය සඳහා බඩ ඉරිඟු සියයට 106 ක්, මුං ඇට සියයට 716 ක්, කව්පි සියයට 426 ක්, සෝයා බෝංචි සියයට 422 ක් සහ තල සියයට 191 ක් සහ රටකජු සියයට 259 ක් වශයෙන් දායක වී ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව, 2020 යල කන්නයේ දී ප්‍රධාන ධාන්‍ය වර්ග වල වගා කළ ඉඩම් ප්‍රමාණය ඉහළ ප්‍රගතියක් වාර්තා කර ඇත.

රූප සටහන 2- කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 තෙවන කාර්තුව




“වී වගාකිරීම” උප ආර්ථික කටයුත්ත යටතේ 2020 තෙවැනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය වෙත එකතුකළ අගය පවත්නා මිලගණන් යටතේ රුපියල් මිලියන 30,864 ක් හා ස්ථාවර ( 2010) මිල ගණන් යටතේ රුපියල් මිලියන 14,861 ක් ලෙස වාර්තා වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 0.8ක් පමණ වේ. වී වගා කිරීම 2019 තෙවැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී සියයට 15.5ක වර්ධනයක් වාර්තා කර ඇත.

“එළවළු වගා කිරීම” උප ආර්ථික කටයුත්තේ මූර්ත දළ එකතුකළ අගය 2020 තෙවන කාර්තුවේ දී පදනම් වන්නේ 2020 වර්ෂයේ යල කන්නයේ නිමැවුම් ඇස්තමේන්තු මතයි. එහිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වගා කළ බිම් ප්‍රමාණය පිළිබඳ දත්ත මූලිකව ම යොදාගනිමින් මෙම කාර්තුවේ එළවළු වගා කිරීම ආර්ථික කටයුත්තේ ඇස්තමේන්තු සකස් කර ඇත. අදාල දත්ත අනුව පහතරට එළවළු වර්ග සියල්ලේ ම පාහේ සහ උඩරට එළවළු වර්ග බහුතරයක වගා කළ ඉඩම් ප්‍රමාණය වැඩිවී ඇත. තව ද ගෙවතු බෝග වගා කිරීම යටතේ ද එලවළු වගා කළ බිම් ප්‍රමාණය වැඩිවී ඇති අතර එළවළු නිෂ්පාදකයන්ගේ මිල දර්ශකය ද ඉහළ යෑමක් වාර්තා කර ඇත. මේ අනුව එළවළු වගා කිරීම උප ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 12.1ක වර්ධනයක් වාර්තා කර ඇත.

ප්‍රධාන වශයෙන් ම පොල් වගාවෙන් සමන්විත වන තැඹිලි ද ඇතුලත් “තෙල් සහිත පළතුරු වගා කිරීම” උප ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ වාර්තා කළ දළ එකතුකළ අගය රුපියල් මිලියන 16,451 ක් වේ. එමගින් පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය සියයට 0.8 ක් වේ. 2020 තෙවන කාර්තුවේ දී මෙම උප ආර්ථික කටයුත්ත සියයට 5.1 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ අවසාන භාගයේ පටන් මෙම වර්ෂයේ මුල් කාලය තුළ බලපෑ වර්ෂාව රහිත කාලගුණික තත්ත්වය මේ සඳහා බලපා ඇත. එහිදි පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ සාමාන්‍ය මිල 2019 තෙවන කාර්තුවේ පැවති රුපියල් 29 සිට රුපියල් 50 දක්වා සියයට 75ක වැඩිවීමක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත. තව ද මෙම කාර්තුවේ දී පොල් ගෙඩි දහස් 4,600ක් අපනයනය කර ඇති අතර එය පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 26ක අඩුවීමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් තැඹිලි අපනයනය මෙම කාර්තුවේ දී සියයට 25 කින් වැඩිවීමක් වාර්තා කර ඇත.

“තේ වගා කිරීම” උප ආර්ථික කටයුත්ත 2019 තෙවැනි කාර්තුවේදී වාර්තා කර තිබූ සියයට 14.2 ක ධන වර්ධනය හා සැසඳීමේදී 2020 තෙවැනි කාර්තුවේදී වාර්තා කර ඇත්තේ සියයට 4.3 ක සෘණ වර්ධනයකි. 2020 තෙවැනි කාර්තුවේදී නිමි තේ නිෂ්පාදනය සියයට 4.2 ක අඩුවීමක් වාර්තා කර ඇත. 2019 තෙවැනි කාර්තුව සමග සැසඳීමේදී කොළඹ තේ වෙන්දේසියේ නිමි තේ කිලෝවක සාමාන්‍ය මිල රු. 505 සිට රු.615දක්වා සියයට 21.9 ක වර්ධනයක් මෙම කාර්තුවේදී වාර්තා කර ඇති නමුත් සමස්ත තේ නිෂ්පාදනය සඳහා සියයට 64.2 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහත රට තේ නිෂ්පාදනය සියයට 6.7ක අඩුවීමක් 2020 තෙවැනි කාර්තුවේදී වාර්තා කර ඇත.

“රබර් වගා කිරීම” උප ආර්ථික කටයුත්ත 2020 තෙවැනි කාර්තුවේදී සියයට 11.5 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එය පෙර වර්ෂයේ තෙවැනි කාර්තුවේදී සියයට 19.8 ක පසුබැස්මක් වාර්තා කර තිබුනි. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව, සකස්කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිල රු. 291 සිට රු. 300 දක්වා සියයට 3.1 කින් 2020 තෙවැනි කාර්තුවේදී වැඩි වී ඇත.

“අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම” උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොට්ට කිලංගු වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. මෙහි සමස්ත එකතුකළ අගය ස්ථාවර මිල ගණන් යටතේ 2020 තෙවන කාර්තුව සඳහා රුපියල් මිලියන 4,088 ක් ලෙස වාර්තා වූ අතර මෙහි සියයට 1.1 ක වර්ධනයක් 2020 තෙවන කාර්තුවේ දී වාර්තා වී ඇත. පොල් රා මැදීම හැර අනෙකුත් සියලුම උප කොටස් ගී වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා වී ඇති අතර බුලත් අපනයනය ද සියයට 3.3ක වර්ධනයක් වාර්තා කර ඇත.

“සත්ව නිෂ්පාදන” ක්‍රියාකාරකම කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙමගින් 2020 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය වෙත එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 17,040 ක් ලෙස වාර්තා වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 0.9ක් පමණ වේ. මෙම කාර්තුවේ දී සත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2019 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 2.8 ක වර්ධනයක් වාර්තා කර ඇත. සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා වලට අනුව එළුවන් හැර අනෙකුත් සෑම මස් වර්ගයක ම නිෂ්පාදනය මෙම කාර්තුවේ දී අඩුවී ඇත. කිරි නිෂ්පාදනය මෙම කාර්තුවේ දී වැඩිවී ඇති අතර කිරි සඳහා ඇති ඉහළ ඉල්ලුම පෙන්නුම් කරමින් කිරි ලීටරයක මිල රුපියල් 76 සිට රුපියල් 80 දක්වා සියයට 5.0කින් පමණ වැඩිවී ඇත. තව ද බිත්තර නිෂ්පාදනය සුළු අඩුවීමක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇති අතර බිත්තරයක මිල රුපියලත් රුපියල් දෙකත් අතර ප්‍රමාණයකින් වැඩිවීමක් 2020 තෙවන කාර්තුවේ දී දැකගත හැකි විය.

“වන වගා සහ දැව කඳන් නිෂ්පාදන” ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දී සියයට 7.8 ක පසුබෑමක් 2019 තෙවන කාර්තුවට සාපේක්ෂව වාර්තා කර ඇති අතර මෙම ආර්ථික කටයුත්තෙහි ස්ථාවර මිල ගණන් යටතේ එකතු කළ අගය 2020 තෙවන කාර්තුව සඳහා වාර්තා වන්නේ රුපියල් මිලියන 16,183 ක් වශයෙනි. මෙම ආර්ථික කටයුත්තේ වටිනාකමෙන් සියයට 90ක් පමණ ම දැව කඳන් නිෂ්පාදනයෙන් සමන්විත වන අතර දර නිෂ්පාදනය ද එහි ඇතුලත් වේ. මෙම කාර්තුවේ දී රාජ්‍ය දැව සංස්ථාවේ පමණක් දැව කඳන් නිෂ්පාදනය සියයට 16.4ක අඩුවීමක් වාර්තා කර ඇත.

“කරදිය ධීවර හා ජලජීවි වගාව” පවත්නා මිල ගණන් යටතේ 2020 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 1.0 ක පමණ දායකත්වයක් ලබා දෙන අතර එහි වටිනාකම රුපියල් මිලියන 40,159ක් වේ. 2020 තෙවන කාර්තුවේ දී මෙහි සියයට 11.6ක පසුබෑමක් වාර්තා වන අතර ධීවර අමාත්‍යාංශ වාර්තා අනුව සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සියයට 12.2ක අඩුවීමක් වාර්තා කර ඇත. මේ සඳහා කෝවිඩ් වසංගතය ආශ්‍රිතව ඇති වූ අපනයන ඉල්ලුම අඩුවීම, රටතුළ මත්ස්‍ය බෙදාහැරීම් කටයුතු අඩාල වීම බලපා ඇත. තව ද ධීවර කටයුතුවල යෙදෙන මුහුදු ප්‍රදේශවලට බලපෑ තද සුළං සහිත අයහපත් කාලගුණික තත්ත්වය සහ අනතුරු ඇඟවීම් නිසා ගාල්ල, තංගල්ල, මඩකලපුව, යාපනය, මන්නාරම යනාදි ප්‍රධාන ධීවර කලාපවල ධීවර කටයුතු සුපුරුදු පරදි සිදු නොවීම මේ අඩුවීම

සඳහා වැඩි වශයෙන් බලපා ඇත. මේ අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 20.6ක වර්ධනයක් 2020 තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

## 1.2 කර්මාන්ත ක්‍රියාකාරකම්

කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 27.7 ක දායකත්වයක් ලබා දෙන අතර සියයට 0.6ක වර්ධනයක් වාර්තා කර ඇත. පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 3.5ක වර්ධනයක් වාර්තා කර තිබුණි.

දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 2.1 ක පමණ දායකත්වයක් සහිත "පතල් හා කැණීම් කර්මාන්තය" 2020 තෙවන කාර්තුවේදී සියයට 6.8ක පසුබැමක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්ත ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් , මැණික් කැනීම් සහ අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් යනාදියෙන් සමන්විත වන අතර ඉන් ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් මෙම කටයුත්ත සඳහා ඉහළ ම දායකත්වය ලබා දෙනු ලැබේ. ඉදිකිරීම් කර්මාන්තයේ වාර්තා වන පසුබැසීම මෙම ආර්ථික කටයුත්ත සඳහාත් අහිතකර ලෙස බලපාන අතර ඒ අනුව මෙම කාර්තුවේ දී මෙහි සෘණ වර්ධන වේගයක් වාර්තා වී ඇත.

රූපසටහන 3 – කර්මාන්ත ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 තෙවන කාර්තුව




### 1.2.1 නිමැවුම් කර්මාන්ත කටයුතු

2020 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු වලදී කොවිඩ් -19 වසංගතයේ අහිතකර බලපෑමට ලක්වෙමින් තිබු නිමැවුම් කර්මාන්ත කටයුතු බොහෝමයක් 2020 තෙවන කාර්තුවේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

“නිමැවුම් කර්මාන්ත කටයුතු” සමස්තයක් වශයෙන් 2020 තෙවන කාර්තුවේ දි සියයට 5.3ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6.9ක දායකත්වයක් සහිත “ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන” නිමැවුම් කර්මාන්ත ආර්ථික කටයුත්ත 2019 තෙවන කාර්තුවේ දී වාර්තා කර තිබු සියයට 5.6ක වර්ධනයට සාපේක්ෂව මෙම කාර්තුවේ දී සියයට 11.5ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කර ඇත.

එසේ ම “රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදනය” 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 3.8 ක වර්ධනයක් වාර්තා කර තිබූ අතර තවදුරටත් 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 0.1 ක වර්ධනයක් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් “ගල් අඟුරු නිෂ්පාදනය සහ ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව” නිෂ්පාදන කර්මාන්තය 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 6.2ක පසුබෑමක් වාර්තා කර ඇත.

“රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය 2019 තෙවන කාර්තුවේ සියයට 4.4 ක පසුබෑමක් වාර්තා කර තිබූ අතර එය 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 4.8ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳ දර්ශකවලට අනුව රබර් අපනයන ප්‍රමාණය සියයට 15.4 කින් වැඩි වී ඇති බව වාර්තාවේ .

කොවිඩ් -19 වසංගතයේ ධන බලපෑමක් වශයෙන් දැකිය හැකි විෂබීජ නාශක දියර නිෂ්පාදනය සහ ආයුර්වේද නිෂ්පාදන වැඩි වීම හේතුවෙන් 2020 වර්ෂයේ තෙවන කාර්තුවේදී “රසායනික නිෂ්පාදන සහ මූලික ෆාමසි නිෂ්පාදන” කර්මාන්තය සියයට 13.1ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. එහි 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට සියයට 4.4 ක වර්ධනයක් වාර්තා වී පැවතුණි.

නිමැවුම් කර්මාන්ත අතුරෙන් “ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන” 2019 තෙවන කාර්තුවේ දී වාර්තා කළ සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව මෙම කාර්තුවේ දී තවදුරටත් සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කර ඇත. ඒ සඳහා දේශීය සිමෙන්ති නිෂ්පාදන ඉහළ යාම බලපා ඇත . එසේ ම ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ටයිල් නිෂ්පාදන සහ සෙරමික් නිෂ්පාදන ) ඉහළ යාම ද මෙහි වර්ධනයට බලපා ඇත.

“කඩදාසි හා කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන” මුද්‍රණයට අදාල නිමැවුම් ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට10.2 ක වර්ධනයක් වාර්තා කර ඇති 2020 මහා මැතිවරණයට අදාළව මුද්‍රණ කටයුතු වැඩිවශයෙන් සිදුවීම මේ සඳහා හේතුවි ඇත. පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ දී මෙහි වාර්තා වී පැවතියේ සියයට සියයට 5.9 ක පසුබෑමකි.

1.2.2 අනෙකුත් කර්මාන්ත ආර්ථික කටයුතු

“විදුලිය නිෂ්පාදන” කර්මාන්තයෙහි මූර්ත එකතු කළ අගය 2020 තෙවන කාර්තුවේ දී සියයට 2.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම කාලපරිච්ඡේද අතරදී තුළ මුළු විදුලිබල ජනනය ගිගාවොට් 3,995 සිට ගිගාවොට් 4,088 දක්වා සියයට 2.3 කින් වැඩිවී ඇත. සමස්ත විදුලි බල ජනනයෙන් ජල විදුලිබල

ජනනය:තාප විදුලිබල ජනනය: NCRE අතර අනුපාතය 27:68:05 ලෙස 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා වී තිබූ අතර 2020 තෙවන කාර්තුවේ දී එම අනුපාතය 37:60:06ක් ලෙස වාර්තා විය.

"ජලය එක්රැස් කිරීම,පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" උප ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දී සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙහිදී පිරිපහදු කළ ජල ප්‍රමාණය ඝන මීටර 189,090 සිට 196,623 දක්වා සියයට 4.0 කින් වැඩිවී ඇත.

2020 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 6.5 ක් වූ දායකත්වයක් සහිත "ඉදිකිරීම් කර්මාන්තය" 2019 තෙවන කාර්තුවට සාපේක්ෂව 2020 තෙවන කාර්තුවේ දී සියයට 9.1 ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුළදී සිමෙන්ති ආනයනය සියයට 21.5 කින් අඩුවීම මෙහි වාර්තාවන ඍණ වර්ධනය කෙරෙහි මූලිකව ම බලපා ඇත. එහිදි දේශීය සිමෙන්ති නිෂ්පාදනය සියයට 24 කින් ඉහළ ගොස් ඇති නමුත් සමස්ත සිමෙන්ති සැපයුම සියයට 2.4 ක අඩුවීමක් වාර්තා කර ඇත. මෙම කාර්තුවේදි ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වටිනාකම සියයට 33.9 කින් අඩුවී ඇත. එසේම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ගණනය කරන ලද සමස්ත ඉදිකිරීම් පිරිවැය දර්ශකය මෙම කාර්තුවේදී සියයට 3.3 කින් ඉහළ ගොස් තිබේ.

## 1.3 සේවා ක්‍රියාකාරකම්

දළ දේශීය නිෂ්පාදිතය සඳහා 2020 තෙවන කාර්තුවේ දී සියයට 56.8 ක පමණ දායකත්වයක් ලබා දෙන සේවා ආර්ථික කටයුතු මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකරනු ලබන අගය පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් යටතේ පිළිවෙලින් රුපියල් මිලියන 2,318,427ක් සහ රුපියල් මිලියන 1,483,511ක් වශයෙන් මෙම කාර්තුවේ දී වාර්තා වී ඇත. එහිදී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.1ක වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

රූපසටහන 4 – සේවා ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 තෙවන කාර්තුව



“තොග සහ සිල්ලර වෙළඳාම” සේවා ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 11.0 ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2019 තෙවන කාර්තුවේ වාර්තාවූ සියයට 2.1 ක වර්ධනය හා සැසඳීමේදී 2020 තෙවන කාර්තුවේදී සියයට 2.9 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෝවිඩ් -19 වසංගතයේ පළමු රැල්ලට පසු නව සාමාන්‍යකරනයත් සමග 2020 තුන්වන කාර්තුව පුරාම රට තුළ ව්‍යාපාරික කටයුතු හා ජනතාවගේ එදිනෙදා ජීවන රටාවන් සාමාන්‍ය තත්වයට පත්වෙමින් තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස තොග හා සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් මෙම කාර්තුවේදී සියයට 2.9 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

තොග හා සිල්ලර වෙළඳාම යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාම මෙන්ම ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ, විනෝදාස්වාදය, නවාතැන් හා නිවාස යනාදි අංශ ද ආවරණය කරයි.

ආනයනවල අඩුවැඩි වීම සහ දේශීය නිෂ්පාදිතයේ අඩුවැඩි වීම තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2019 තෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 891,263 වූ අතර 2020 තෙවන කාර්තුව සඳහා එය මිලියන 760,928 දක්වා සියයට 14.6 කින් අඩු වී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ පැවති රු. මිලියන 178,312 සිට රු. මිලියන 145,410 දක්වා සියයට 18.5 කින් අඩු වී ඇත . ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2019 තෙවන කාර්තුව හා සසඳන විට 2020 තෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 16.6 කින් අඩු වී ඇති අතර, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 6.7 කින් අඩු වී තිබේ. එසේ ම, 2020 තෙවන කාර්තුවේදී කාර්මික නිෂ්පාදනයේ සිදුව ඇති වර්ධනය හේතුවෙන් එහි සමස්ත වෙළඳ ආන්තික වටිනාකම 2019 තෙවන කාර්තුව හා සසඳන විට රු. මිලියන 324,829 සිට රුපියල් මිලියන 357,925 දක්වා සැලකිය යුතු ලෙස සියයට 10.2 කින් වර්ධනය වී තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2019 තෙවන කාර්තුව හා සසඳන විට 2020 තෙවන කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් සඳහා වන මුළු අපනයන වටිනාකම සියයට 5.6 කින් වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය කැපී පෙනෙන ලෙස සියයට 15.6 කින් වර්ධනය වී තිබේ. එහිදී කාර්මික අපනයන පරිමා දර්ශකය සහ කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේදී පිළිවෙලින් සියයට 18.2කින් සහ සියයට 5.7 කින් වර්ධනය වී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන ආර්ථික ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් උප කාර්යයන් ගෙන් සමන්විත වේ.

2020 තෙවන කාර්තුවේදී භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය ධන වර්ධනයක් වාර්තා කර ඇත. එය විශාල වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය සහ ත්‍රිවීල් මගින් සිදුවූ ප්‍රවාහනය මගින් ලැබී ඇත. කෙසේ වෙතත් මුහුදු මාර්ග ප්‍රවාහන සේවාවන් සහ ගුවන් ප්‍රවාහන කටයුතු යන ද්විත්වය ම වාර්තා කර ඇත්තේ සෘණ වර්ධන වේගයකි. මේ අතර ප්‍රවාහන කටයුතු සඳහා සහායක සේවාවන් සහ ගබඩාකරණ පහසුකම් සැපයීම් ධන වර්ධනයක් වාර්තා කර ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන් මෙම ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දී සියයට 0.9ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

ප්‍රවාහනය ආර්ථික කටයුත්තේ උප අංශ සැලකිමේ දී ගුවන් ප්‍රවාහන සේවාවන් මගින් ඉපයූ ආදායම සියයට 76කින් අඩුවී ඇත. මුහුදු මාර්ග ප්‍රවාහන සේවාවන් මගින් ඉපයූ ආදායම සියයට 48කින් අඩුවී ඇත. ප්‍රවාහන කටයුතු සඳහා සහය සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම මගින් ඉපයූ ආදායම සියයට 1.1කින් වැඩිවී ඇත.

“තැපැල් සේවා හා කුරියර් සේවා” උප අංශය සැලකීමේදී, 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී එහි වාර්තා වන වර්ධනය සියයට 7.0කි. එහිදී තැපැල් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සැලකූ විට එහි සමස්ත වියදම 2019 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 0.8කින් වැඩිවී ඇති අතර සේවක පිරිවැය සියයට 1.6කින් වැඩිවී ඇත.

“නවාතැන්, ආහාර පාන සැපයීම්” සේවා ආර්ථික කටයුත්ත 2019 තෙවන කාර්තුව හා සසඳන විට 2020 තෙවන කාර්තුවේදී සියයට 42.1 ක පසුබෑමක් වාර්තා කර ඇත. කෝවිඩ් -19 වසංගතය දිගින් දිගටම ගෝලීයව පැතිර යත්ම දිවයිනට පැමිණෙන සියලුම මගී ගුවන් ගමන් ශ්‍රී ලංකා රජය විසින් තහනම් කරන ලදී. මෙය ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම ශුන්‍ය අගයක් වාර්තා වීමට හේතු විය. කෙසේ වෙතත් තුන්වන කාර්තුව පුරාම රටේ සුඛෝපභෝගී හෝටල් බොහොමයක්ම ඔවුන්ගේ හෝටල් වෙත දේශීය සංචාරකයන් ආකර්ෂණය ලබා ගැනිම සඳහා ආකර්ශනීය ප්‍රවර්ධන පැකේජ ලබා දි තිබිම නිසා දේශීය සංචාරක ආකර්ෂණය ලබා ගැනීමට හැකි වු අතර එමඟින් පිරිවැටුමේ අඩුවීම යම් දුරකට අවම කර ගැනීමට හැකි විය. කෙසේ වෙතත්, කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන වාර්තා අනුව 2019 තුන්වන කාර්තුවට(ජූලි 01 සිට සැප්තැම්බර් 30) සාපේක්ෂව 2020 තෙවන කාර්තුවේදී එකී හෝටල්වල කාර්තුමය පිරිවැටුම සියයට 66 කින් අඩු වී ඇත.

“වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම” යන සේවා ආර්ථික කටයුත්තේ දළ එකතුකළ අගය 2019 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 8.1 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ සියයට 3.1ක වැඩිවීමක් වාර්තා කර ඇත.

“සන්නිවේදන සේවාවන් සැපයීම” උප ආර්ථික කටයුත්ත 2020 තෙවන කාර්තුවේ දී සියයට 16.6ක සැලකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මෙම කාර්තුවේ දී මෙහි සමස්ත ආදායම රුපියල් බිලියන 48ක් ලෙස වාර්තා වන අතර කර්මාන්තයේ සමහර ප්‍රධාන ආයතනවල ලාභ දෙගුණ වීමක් වාර්තා වී ඇත. කෙසේ වෙතත් ජංගම දුරකථන සම්බන්ධතාවන්ගේ සමුච්චිත ප්‍රමාණය අඩුවීමක් මෙම කාර්තුවේ දී දැකිය හැකි නමුත් දත්ත භාවිතා කරමින් සිදුකරන අන්තර්ජාල පාවිච්චිය විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ.

“තොරතුරු තාක්ෂණය ඇතුළු තොරතුරු තාක්ෂණ වැඩසටහන් සහ උපදේශනය” සේවා ආර්ථික කටයුත්ත කොවිඩ් -19 වසංගතය මධ්‍යයේ වුව ද මෙම වසරේ තෙවැනි කාර්තුව සඳහා සියයට 13.5 ක සැලකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මෙම කර්මාන්තයේ බොහෝ සමාගම් නිවසේ සිට වැඩ කිරීමෙ ක්‍රමවේදය අනුගමනය කරමින් වැඩ කටයුතු පවත්වාගෙන යාම සිදුකරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් ශේෂ ලේඛන වාර්තාවලට අනුව පරිගණක සේවාවන්ගෙන් අපනයන ආදායමේ වටිනාකම මෙම කාලය තුළ රුපියල් මිලියන 44,640 සිට රුපියල් මිලියන 51,403 දක්වා සියයට 15.2 කින් ඉහළ ගොස් තිබේ.

“මුල්‍ය සේවා සැපයීම” ආර්ථික කටයුත්තේ 2020 තෙවන කාර්තුව සඳහා වර්ධනය සියයට 12.3 ක් ලෙස වාර්තා වේ. එහිදි මෙම වර්ෂයේ තෙවන කාර්තුව සඳහා ස්ථාවර මිල ගණන් යටතේ වාර්තා වන එකතුකළ අගය රුපියල් මිලියන 202,023ක් ලෙස වාර්තා වන අතර එය පෙර වර්ෂයේ තෙවන කාර්තුව සඳහා රුපියල් මිලියන 179,848ක් ලෙස වාර්තා විය. මුල්‍ය සේවාවන්හි භාවිතාව, “ණය සහ අත්තිකාරම් වටිනාකම” සහ “මුළු තැන්පතු වටිනාකම” මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2020 තෙවන කාර්තුවේ දී පිළිවෙලින් සියයට 13.8 කින් සහ සියයට 18.5 කින් වැඩි වී ඇත. 2020 තෙවන කාර්තුවේ දී “හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය “ සහ “හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය “ පිළිවෙලින් සියයට 11.2 ක් සහ සියයට 6.4 ක් ලෙස සටහන් විය.

“රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ” කටයුතු වල මූර්ත එකතු කල අගය 2020 තෙවැනි කාර්තුවේ දී සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එය 2019 තෙවන කාර්තුවේ දි සියයට 6.3 ක වර්ධනයක් වාර්තා කර තිබුණි. මෙම කාලයේදී රක්ෂණ සමාගම් වල සේවක ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි 5.1 ක වර්ධනයක් වාර්තා වී ඇත. මෙම සේවාව කෙතරම් භාවිත වූයේ දැයි නිරූපනය කෙරෙනුයේ “උපයන ලද රක්ෂණ වාරික වටිනාකමෙන්” සහ “උපයන ලද හිමිකම් වටිනාකමෙනි”. මෙම කාර්තුවේ දී රක්ෂණ සේවාවේ උපයන ලද රක්ෂණ වාරික වටිනාකමේ අගය සියයට 12.4 කින් වැඩිවී ඇති අතර උපයන ලද හිමිකම් වටිනාකමේ අගය සියයට 6.3 කින් අඩුවී ඇත. මෙම අඩුවීම සඳහා සාමාන්‍ය රක්ෂණයේ උපයන ලද හිමිකම් වටිනාකමේ අඩුවීම හේතුවී ඇත.

“දේපොල වෙළදාම් හා නිවාස අයිතිය” සේවා ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 5.9 ක දායකත්වයක් සපයනු ලබන අතර ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ වටිනාකම රුපියල් මිලියන 150,147ක් ලෙස වාර්තා වේ. 2019 තෙවන කාර්තුවට සාපේක්ෂව 2020 තෙවන කාර්තුවේ දී එහි සිදුවී ඇති වර්ධනය සියයට 3.1 ක් ලෙස වාර්තා වේ.

“වෘත්තීය සේවා” 2020 තෙවන කාර්තුවේ දී සියයට 1.5 ක වර්ධනයක් වාර්තා කර තිබේ. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් “ නීති හා ගිණුම් කාර්යයන්”, “ගෘහනිර්මාන හා ඉංජිනේරු කාර්යයන්”, “ විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්” “ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්” සහ “ප්‍රකාශන කාර්යයන්”, “පශු වෛද්‍ය කාර්යයන්”. “කුලී හා බදු කාර්යයන්”, “රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්” සහ “ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් ” යන කාර්යයන්ගෙන් ගෙන් සමන්විත වේ. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය සියයට 1.7ක් පමණ වන අතර ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 43,070ක වටිනාකමක් 2020 තෙවන කාර්තුවේ දි වාර්තා කර ඇත.

2020 තෙවන කාර්තුවේදී “සෞඛ්‍ය සේවා” ආර්ථික කටයුත්ත පසුගිය වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 4.6 ක වර්ධනයක් වාර්තා කර තිබේ. විශේෂයෙන් මෙම කාර්තුවේ දී පෞද්ගලික සෞඛ්‍ය සේවා කටයුතු සැලකිය යුතු ලෙස පුළුල් විය. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත දිවයිනේ ප්‍රධාන රෝහල් සමාගම් පහක මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඒවායේ කාර්තුමය පිරිවැටුම 2019 තෙවන කාර්තුවට සාපේක්ෂව 2020 තෙවන කාර්තුවේ දී සියයට 6 කින් වැඩි වී ඇත. මීට අමතරව මෙම කාර්තුව තුළ විශේෂඥ වෛද්‍යවරු හමුවීමේ විද්‍යුත් සේවා භාවිතය ( e-channeling services ) සැලකිය යුතු ලෙස වැඩිවී වී ඇත.

“වෙනත් පුද්ගල සේවා කාර්යයන්” දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.6ක පමණ දායකත්වයක් සපයන අතර ප්‍රධාන උප ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත වේ. ඒ “කලා හා පොදු විනෝදාත්මක කාර්යයන්” සහ “අනෙකුත් පෞද්ගලික කාර්යයන්” වශයෙනි. 2020 තෙවන කාර්තුවේ දී රට සමස්තයක් වශයෙන් සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට පත්වෙමින් එදිනෙදා ජනජීවිතව යථාතත්ත්වයට පත්වීමක් දැකිය හැකි වුවත් ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාවය රැකගැනීම සඳහා තවදුරටත් ක්‍රියාත්මකව පවතින සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම ආර්ථික කටයුත්තේ ප්‍රසාරණය කෙරෙහි විශාල සානුබලයක් ආර්ථිකය තුළ තවමත් නොමැති අතර ඒ අනුව 2019 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී ඉහත ආර්ථික කටයුත්තෙහි මූර්ත එකතු කළ අගය සියයට 0.5 ක සුළු පසුබෑමක් වාර්තා කර ඇත.

ජාතික ගිණුම් අංශය-ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දු.ක. **94-11-2147071** ෆැක්ස්: **94-11-2877938** ඊමේල්: **national.accounts@statistics.gov.lk**